**සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව- 2021**

**-------------------------------------------------------------------------------**

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 6 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ථාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. විගණන නිරීක්ෂණ

### 2.1 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්

සංස්ථාව විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් ,බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 6,458,394,856 |
| ජංගම වත්කම් | 4,592,315,521 |
| | ------------------- |
| **මුළු වත්කම්** | **11,050,710,377** |
| | ========== |

| | |
|---|---|
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | (2,941,269,573) |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 8,310,536,743 |
| ජංගම බැරකම් | 5,681,443,207 |
| | ------------------- |
| **මුළු බැරකම්** | **11,050,710,377** |
| | ========== |
| මුළු ආදායම | 433,018,066 |
| මුළු වියදම | 1,051,993,321 |
| **අතිරික්තය / (ඌණතාවය)** | ------------------- |
| | **(618,975,255)** |
| | =========== |

**2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) දීර්ඝ කාලයක් මුළුල්ලේ ලැබිය යුතු බදු කුලී ලෙස දක්වා තිබුණු රු.88,071,071 ක මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නො තිබුණි. | දීර්ඝ කාලයක් මුළුල්ලේ ලැබිය යුතු බදු කුලී සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු දැක්වීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සොයා බලා අය කර ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇත.එකී කමිටුව විසින් අදාල ගිණුම් සන්සංදනය කර මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරමින් සිටින අතර, දීර්ඝ කාලයක් මුළුල්ලේ පවතින හිඟ මුදල් සම්බන්ධයෙන් මූලාශ්‍ර සොයා ගැනීමට අපහසු වී ඇත.මේ සම්බන්ධව විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී ද කරුණු වාර්තා කර ඇති අතර, දීර්ඝ කාලයක් මුළුල්ලේම පවතින හිග ශේෂයන් කපා හැරීමට හෝ , හිඟ බදු කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.<br>තවද, හිඟ බදු මුදල් අයවීමට ඇති ආයතන වෙත කඩිනමින් හිඟ මුදල් ගෙවන ලෙස ලිපි දැනටමත් යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් කඩිනමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු දක්වන ලෙසට ද අදාල කමිටුව වෙත උපදෙස් ලබා දී ඇත. | ලැබිය යුතු බදු කුලී අය කර ගත යුතුය. |
| (ආ) ලැබිය යුතු වෙළෙඳ ශේෂ යටතේ දක්වා ඇති එකතුව රු.64,563,,436 ක් වූ ශේෂයෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු ශේෂ සන්සංදනය කිරීම හා අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු වාර්තාවීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කරන ලද අතර, ඔවුන් විසින් මෙම ශේෂ අදාල ආයතන සමඟ සැසඳීම් කර අයකර ගැනීමට කටයුතු කරනු ලබයි. | අයවිය යුතු ශේෂ අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සම්බන්ධිත පාර්ශවයන්ගෙන් අයවිය යුතු ශේෂය වශයෙන් වූ රු.24,202,985 ක මුදල සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන නොතිබුණි. | මෙම ශේෂය සකස් වී ඇති ආකාරය පිලිබඳව පිළිතුරු ලබා දීමට ප්‍රමාණවත් සාක්ෂි මූල්‍ය අංශය සතුව නොමැත. එම නිසා මෙහි දක්වා ඇති ශේෂය අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 දක්වා ඇති පරිදි හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර මූල්‍ය වාර්තා සකස් කර ඇත. | අයවිය යුතු ශේෂ අය කර ගත යුතුය. |
| (ඈ) ගිණුම්කරණ පද්ධතියෙන් ලබා ගත් තොරතුරු අනුව 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලංකා සතොස සමාගමෙන් සහ වී අලෙවි මණ්ඩලයෙන් සංස්ථාව වෙත අයවිය යුතු මුදල පිළිවෙලින් රු.2,108,027,028 ක් සහ 94,059.338 ක් වූ අතර සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත සහ වී අලෙවි මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු 89,228,614 ක් සහ රු.966,666,192 ක් වී තිබුණි. මෙම අයවිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ඒ සම්බන්ධයෙන් අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ එම මුදල් අයකර ගැනීමට හා ගෙවීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | ආනයනික සහල් සහ දේශීය සහල් අලෙවිය වෙනුවෙන් ලැබිය යුතු මුදල් ගෙවීම සඳහා ලංකා සතොස විසින් ගෙවීම් සැලැස්මක් යෝජනා කර දී ඇත. ලංකා සතොස විසින් 2022 සැප්තැම්බර් 01 දින සිට මාසිකව රු,.25,000,000.00 වසර 06 ක් තුල සතොස වෙත ගෙවීම් කිරීමට එකග විය. වී අලෙවි මණ්ඩලය සහ ලංකා සතොස ආයතන වල ශේෂයන් සැසදීමට සහ අය කරගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවකයින් පත් කර ඇති අතර ඔවුන් විසින් අදාල කටයුතු සිදුකරමින් පවතී.මේ අනුව සංස්ථාව විසින් අදාල ශේෂ අයකර ගැනීමටත් සැසදීම් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත. | අදාල ආයතන සමග එකගතාවයකට පැමිණ ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කල යුතුය. |
| (ඉ) 2011 වර්ෂයේ සිට පැවත එන විවිධ ණය ගැතියන්ගෙන් සංස්ථාවට අයවිය යුතු රු.36,751,643 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | මෙහි දක්වා ඇති ශේෂය අයකර ගැනීමට හැකියාවක් නොමැති බැවින් ගිණුම් ප්‍රමිත අංක 36 දක්වා ඇති පරිදි හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර මූල්‍ය වාර්තා සකස් කර ඇත. සියළු ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි ආයතනය තුල කමිටුවක් පත්කර තිබෙන අතර, ඔවුන් විසින් මෙම ශේෂ සැසඳුම් කර අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත. | අයවිය යුතු ශේෂ අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1969 අංක 12 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනත අනුව සංස්ථාවේ පහත සඳහන් අරමුණ ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>(i) සමුපකාර සමිති වල අවශ්‍යතා ප්‍රසම්පාදනය හා සැපයීම | 2021 වර්ෂය තුලද රටතුල පැතිරී ගිය කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, සංචරන සීමා පැනවීම, ආදී කරුණු නිසා ආයතනයේ කටයුතු විධිමත් පරිදි පවත්වා ගෙන යාමට නොහැකි | පනතේ අරමුණු ඉටු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ii) සියළු අකාරයේ භාණ්ඩ සම්බන්ධයෙන් අපනයනකරුවෙකු, ආනයනකරුවෙකු , තොග සහ සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් කටයුතු කිරීම<br>(iii) අදාල අමාත්‍යවරයා සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත කෘෂිකාර්මික හා කාර්මික කටයුතු හෝ බැංකු සහ නාවික කටයුතු ඇතුළු වෙනත් වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු සිදු කිරීම. | වන ලදි. 2021 වසර තුල කොවිඩ් වසංගතය පැවතීම හේතුවෙන්, සතොස ආයතනයේ මුඛ්‍ය පරමාර්ථයෙන් බැහැරව රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමෙහිලා සතොස ආයතනය කටයුතු කරන ලදි. | |
| (ආ) 2021 වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව මූල්‍ය කාර්යසාධනය ඉහල නැංවීමට සහ පාරිභෝගික තෘප්තිය වැඩිකිරීම සඳහා සැලසුම් කර තිබුණු පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (i) මුං ඇට , කව්පි , ගම්මිරිස් හා කරවල දේශීය වශයෙන් මිලදී ගෙන බෙදාහැරීම තුලින් මාසිකව ලාභ ප්‍රතිශතය වැඩි කර ගැනීම. | කොවිඩ් වසංගතය පැතිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක කිරිමට නොහැකි විය.. තවද, විදේශ සංචිත අහිමිවීම මත ආනයන සීමා පැමිණවීම හා රජයේ ප්‍රතිපත්තිය මත රසායනික පොහොර තහනම් කර කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම මත අස්වනු අඩුවීම මත දේශීය කෘෂි භෝග මිළදී ගෙන අපනයනය කිරීමට සැලසුම් කළ තිබුණද එකී ව්‍යාපෘති අසාර්ථක වන ලදි. | සැලසුම් කර තිබූ කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ii) රතු පරිප්පු , හාල් මැස්සන් , ටින් මාළු , කඩල හා වියළි මිරිස් යන අත්‍යාවශ්‍ය ආහාර ආනයනය හා බෙදා හැරීම තුලින් ලාභ ප්‍රතිශතය වැඩි කර ගැනීම. | රටතුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සංස්ථාව මගින් ආනයනය කිරීමට බලාපොරොත්තු වූ රතු පරිප්පු, සුදු සීනි, හාල් මැස්සන්, සුදුළූණු , ටින්මාළු,කඩල, හා මුංඇට ආනයනය කිරිමට අවස්ථාව නොලැබුණි. | -එම- |
| (iii) මාසිකව බුලත් බකට් 60,000 ක් අපනයනය කර දෙවන කාර්තුවේ සිට ආදායම වැඩිකර ගැනීම. | මේ සම්බන්ධයෙන් පැන නැගුණු ගැටළු කිහිපයක් නිසා අපනයන කටයුතු නතර කිරීමට සිදුවිය.<br>• රටතුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් වරින්වර විශාල කාලපරාසයක් රට වසා | සැලසුම් කරන අවසථාවේදී පවතින බාධාවන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | දැමීම නිසා මූලිකව ක්‍රියාත්මක කල යුතු කටයුතු අඩපනවීම.<br><br>• ගැණුම්කරු වෙත බුලත් තොගය ලැබුනු පසු මුදල් ගෙවීමට ගැණුම්කරුවන් දන්වා සිටීම මත යම් හෙයකින් බුලත් තොගය ලබා ගෙන මුදල් නොගෙවා සිටියහොත් මුදල් අයකර ගැනීමට දේශීය නියෝජිත ආයතනයක් හෝ නියෝජිතයෙකු නොමැතිවීම.<br><br>• බුලත් නිසි ප්‍රමිතියට නොමැති බව පවසා යම් හෙයකින් තොගය ප්‍රතික්ෂේප කලහොත් නැවත තොගය ගෙන්වා ගැනිමට සිදුවීම හෝ තොගය අස්ථානගතවීම නිසා අධික පාඩුවක් හෝ වියදමක් දැරීමට සිදුවීම.<br><br>• අස්වැන්න නෙලා ඉතා කෙටි කාලයකින් අපනයන කල යුතු බැවින් කටුනායක ගුවන්තොටුපල පරිශ්‍රයේ ගබඩා හා කාර්යාල පහසුකම් ලබාගැනීමට නොහැකිවීම හා ඒ සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම. | |
| (iv) | මෙ.ටො. 5 ක් වූ ලොරි රථ 05 ක් වෙන් කර කාබනික එළවළු ජංගම අලෙවිසල් පිහිටුවීම. | අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරිමට කටයුතු කලත් ඒ සදහා වෙළඳ අමාතයංශයේ අනුමැතිය නොලැබීම නිසා ව්‍යාපෘතිය නතර කිරිමට සිදුවිය. | සැලසුම් කිරීමේදී අදාල කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර සැලසුම් සකස් කිරීම සිදු කල යුතුය. |
| (v) | මාසික බදු කුලී ප්‍රතිශතය වැඩි කිරීම සඳහා ඉඩම් ප්‍රත්‍යාගණනය කර බදුකුලිය වැඩි කර ගැනීම. | 2021 වර්ෂයේ රටතුල පැතිරී ගිය කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, සංචරන සීමා පැනවීම, ආදී කරුණු නිසා වත්කම් ප්‍රත්‍යාගණනය කිරිමට රජයේ තක්සේරු නිලධාරින්ට අදාල ස්ථාන වෙත යාමට දුෂ්කරතා මතුවීම මත එම කටයුතු අතපසුවී ඇත. එසේම එම වර්ෂය තුල ව්‍යාපාර කටයුතු අඩාල වි තිබු අතර නිරෝධායන ඇඳිරිනිතිය පනවා තිබු බැවින් බදු | සැලසුම් කරන ලද කාර්යයන් හැකි පමණකින් හෝ ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| | | කුලී පදනම මත දේපල/පරිශ්‍ර /ගබඩා ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා නොකල බැවින් බදු කුලියට ලබාදීමට නොහැකි වී ඇත. අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත පැවති කුලී මුදලට 10% ක මුදලක් එකතු කර බදු කුලිය වැඩිකර ලබාගත් අතර වර්තමානයේ සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කර රජයේ තක්සේරු මුදලට බදු කුලී මුදල් අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | |
| (vi) | මෝටර් රථ නැවතුම්පලේ පහසුකම් සංවර්ධනය කර මෝටර් රථ නැවතුම් තුලින් ආදායම් ප්‍රතිශතය වැඩි කර ගැනීම. | 2021 වර්ෂයේ රටතුල පැතිරී ගිය කොවිඩ් වසංගත තත්වය පැවතීම හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, සංචරන සීමා පැනවීම, ආදී කරුණු නිසා කොළඹට රථ වාහන පැමිණීම සීමාවීම මත ආදායම් ප්‍රතිශතය වැඩිකර ගැනිමට නොහැකි වී ඇත. 2022 වර්ෂයේ ආදායම් ප්‍රතිශතය වැඩිකර ගැනිම සඳහා ක්‍රියාකරමින් පවතින අතර රාජ්‍ය ආයතන සහ රක්ෂණ ආයතන වෙත ඔවුන්ගේ රථ වාහන නතර කිරිමට මෝටර් රථ නැවතුම්පලේ පහසුකම් සපයාදීම මගින් ආදායම් ප්‍රතිශතය ඉහල නංවා ඇත. | -එම- |
| (vii) | ඒ.ටී.එම්. යන්ත්‍ර හා ඩිජිටල් ප්‍රචාරණ දැන්වීම් ස්ථාපිත කිරීම තුලින් බදුකුලී ආදායම ඉහල දැමීම. | 2020 වර්ෂයේ රටතුල පැතිරී ගිය කොවිඩ් වසංගත තත්වය 2021 වර්ෂය තුලද අඛණ්ඩව පැවතීම හේතුවෙන් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, සංචරන සීමා පැනවීම, ආදී කරුණු නිසා ව්‍යාපාරික ස්ථාන වසා දැමීම , පාඩු ලැබීම ආදී කරුණු නිසා ප්‍රචාරණ දැන්වීම් සඳහා ඉල්ලුමක් නොමැතිවීම හා ඒ.ටී.එම්. යන්ත්‍ර සඳහා ද බැංකු මගින් යහපත් ප්‍රතිචාරයක් නොදැක්වීම මත එම වර්ෂ වල ඒ සඳහා කටයුතු කර නොමැත. | -එම- |
| (viii) | සහල් මෝල්වල ධාරිතාවය පැයකට මෙ.ටො. 2 සිට 2.5 දක්වා වැඩි | මෙම අරමුණ ක්‍රියාත්මක කිරිම සඳහා මුලිකව 2020.02.10 දින | -එම- |

| | | | |
|---|---|---|---|
| | කිරීම තුලින් සහල් නිෂ්පාදනය ඉහල දැමීම. | 2020/1822/08 යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්‍ෂක මණ්ඩලයට ඉදිරිපත් කර පසු අස්වනු තාක්‍ෂණ ආයතනයේ නිරීක්‍ෂන සහ නිර්දේශ යටතේ සහල් මෝල් වල ධාරිතාවය හා ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. කෙසේ වුවත් සහල්මෝල් අලුත්වැඩියා කර නැවත වරක් වැඩ ආරම්භ කරන ලදි. එකී ව්‍යාපෘතියෙන් 2020 වර්ෂය තුල රුපියල් මිලියන 3.2 ක ලාභයක් වාර්තා කර තිබුණි.කෙසේ වුවත් , අවශ්‍ය වී තොග සතොස ආයතනයට සපයා ගැනීමට අවස්ථාවක් නොමැති වූ අතර රජයේ මැදිහත්වීම මත වී මිලදී ගැනීම සෘජුවම වී අලෙවි මණ්ඩලය මගින් පමණක් සිදුකිරීම නිසා සතොස වෙත වී තොග නොලැබීමේ තත්වයක් ඇතිවන ලදි. එම නිසා එම වසර තුල වී කෙටුම් ප්‍රවේශයන් අපේක්‍ෂිත මට්ටමට ලඟා කරගත නොහැකි වන ලදි. | |
| (ix) | පුවත්පත් දැන්වීම් තුලින් මිලගණන් කැඳවා ලොරි රථ සන්නාමකරණය කිරීම. | කොවිඩ් වසංගත තත්වය හමුවේ ව්‍යාපාරික අවස්ථා අවම වී ලාභ ප්‍රතිශත නොමැතිවීම හා රාජ්‍ය ප්‍රතිපත්තීන් මත වියදම් අවම කිරීම තුලින් ප්‍රවර්ධන හා ප්‍රචාරණ වියදම් සීමා කිරීම නිසා ලොරි රථ සන්නාමකරණය කිරීම තාවකාලිකව නතර වී ඇත. කෙසේ වුවත්, ඉදිරියේදී නැවත මේ සම්බන්ධයෙන් අභිලාෂ දැක්වීමට තීරණය කර ඇත. | -එම- |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සතු දේපල අතුරින් කුලියට දීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවති වර්ග අඩි ප්‍රමාණය 161,136 ක් වූ අතර 2015 වර්ෂයේ ඉදිරිපත් කර ඇති වත්කම් ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් බදු | සමාලෝචිත වර්ෂය තුල සංස්ථාව සතු දේපල කුලියට ලබාදීම සඳහා රටේ පැවති කොවිඩ් වසංගත තත්වය තුල නිරෝධායන ඇඳිරිනීතිය ,සංචරන සීමා සහ කාර්යාල වලට පැමිණීම සීමා කිරීම වැනි හේතු මත ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකියාවක් නොතිබූ අතර 2021 | සංස්ථාවේ දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| කුලිය අනුව මෙම ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීමෙන් වාර්ෂිකව රු.52.585.440 ක ආදායමක් සංස්ථාවට අහිමි වී තිබුණි. | වර්ෂය තුල එකි දේපල කුලී පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීමට සංස්ථාව විසින් කටයුතු කර තිබුණි. | |
| (ආ) ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන් වලට වඩා අඩුවෙන් වර්ග අඩියක මිල නියම කිරීම හේතුවෙන් බදු දෙන ලද දේපල වලින් සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවට අහිමි වූ ආදායම රු.107,040,868 ක් වී තිබුණි. | ප්‍රත්‍යාගනන වාර්තාවේ සඳහන් මිල ගණන් වලට අඩුවෙන් ලබාදී ඇති සමහර ගබඩා / දේපල අදාල බදු ගැනුම්කරු විසින් එකී ගබඩාව අලුත්වැඩියා කිරිම සඳහා සිය අරමුදල් යොදා ගෙන ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබාගැනිමෙන් සහ සමහර දේපල සඳහා තක්සේරු වාර්තා ලබාගැනිමටද කටයුතු කර ඇත. එසේම සමහර ගබඩා / දේපල සතොස ආයතනයේ සහෝදර සමාගමක් වන ලංකා සතොස ආයතනය වෙත සහ සතොස ආයතනයේ පරිපාලිත සමාගම් සඳහා කුලී පදනම මත ලබාදී තිබුණි. | ප්‍රත්‍යාගණන වාර්තාවේ සඳහන් මිල ගණන් අනුව බදු කුලී අය කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2019 වර්ෂයේදී සංස්ථාව සතු ගබඩා 13 ක් නවීකරණය කිරීම ආරම්භකර තිබුණු අතර නවීකරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් රු.82,525,632 ක් වැයකර තිබුණි. එම සියළුම නවීකරණ කටයුතු 2020 වර්ෂය තුල අවසන් කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගබඩා 09 ක පමණක් නවීකරණ කටයුතු අවසන් කර තිබුණි. | පෙර අමාත්‍යාංශය යටතේ පැවති අය-වැය ප්‍රතිපාදන මුදල් නව අමාත්‍යාංශය වෙත ලබා ගැනීම සඳහා දිගුකාලයක් ගත වීම,<br>මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද වැඩ නිමවුම් බිල්පත් සඳහා නියමිත පරිදි මුදල් ගෙවීම දිගුකලක් ප්‍රමාදවීම.එම තත්වය තුල ප්‍රමාණ පත්‍රයෙහි සඳහන් මිල මට්ටම්ද ආර්ථිකය තුල වැඩි වීම,<br>මෙම ව්‍යාපෘතිය භාරව කටයුතු කළ සමාගමේ ඉංජිනේරුවරයා අත් අඩංගුවට පත්වීම, එම සමාගම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීම ප්‍රමාද වීම හා එහි හිටපු ප්‍රධාන විධායක සහ ප්‍රධාන ඉංජිනේරුවරයා ඉවත්වීම. දිවයිනතුල සීඝ්‍රයෙන් පැතිර ගිය කොවිඩ් - 19 වෛරස වසංගතය යන කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ අධීක්ෂණයද ගැටළු සහගත තත්වයට පත්විය.<br>ඉහත සඳහන් කරුනු ලැබූ ආයතනයට පාලනය කළ නොහැකි වූ බලපෑම් යටතේ වුවද මේ වන විට මෙම ගබඩා 13 න් 09 ක් නවීකරණ කටයුතු අවසන් කර ඇති බවද සඳහන් කරමි. | සැලසුම් කර තිබූ කාර්යයන් නියමිත කාලය තුලඉටු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සංස්ථාව විසින් ලංකා සතොස සමාගම වෙත ලබාදී ඇති භාණ්ඩ තොග ප්‍රවාහන සේවාව වෙනුවෙන් 2018 හා 2019 වර්ෂයන් සඳහා ලැබිය යුතු ආදායමින් ප්‍රවාහනයේදී සිදු වී ඇති මාර්ගස්ථ අඩුමාන හේතුවෙන් ඉන්වොයිස් වටිනාකමින් රු. 18,819, 050 ක අදායමක් අහිමි වී තිබුණු අතර එය මෙම වාර්තාවේ දිනය දක්වා අයකර ගෙන නොතිබුණි. | ලංකා සතොස භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදවන ලද ලොරි රථවලින් සිදු වී ඇති අඩුමාන සඳහා වගකිව යුතු සේවකයින්ට එරෙහිව පරීක්ෂණ සිදු කර අලාභ අයකර ගැනීමට හා විනයානුකූල පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | මාර්ගස්ථ අඩුමාන වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතුය. |
| (ඇ) සංස්ථාව විසින් ආනයනික සහල් ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත රු.436,164,234 ක් වටිනා සහල් තොග විකුණා තිබුණු අතර , ඒ සඳහා 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති රු.118,011,334 ක මුදල පියවීම සඳහා ලබාදී තිබුණු සියළුම චෙක්පත් අගරු වී තිබුණි. සංස්ථාව විසින් ණය පදනම මත සහල් ලබාදීමේදී රු.100,000,000 ක බැංකු ඇපකර 02 ක් ලබාගෙන තිබුණු අතර එම ඇපකර සත්‍ය ලේඛන බවට තහවුරු කර ගෙන නොතිබුණි. තවද සමාගම විසින් දිගින් දිගටම ණය නොගෙවා සිටියදී ද සමාගම වෙත අඛණ්ඩව සහල් නිකුත් කර තිබුණු අතර මෙම බැංකු ඇපකර සාවද්‍ය ලේඛන බවට හෙළිදරව් වී තිබුණි. මෙම මුදල් ගෙවීම පැහැර හැරීම නිසා සංස්ථාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි. | සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් ආනයනික සහල් තොග ලබාගෙන රු.118,011,334/- මුදලක් වංචා කිරීම සම්බන්ධව , අගරු චෙක්පත් ලබාදීම සහ ව්‍යාජ බැංකු ඇපකරයක් ලබාදීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට පැමිණිලි කර ඒ සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රත් අධිකරණයේ නඩු පවරා ඇති අතරම, කොළඹ වාණිජ මහාධිකරණයේ සිවිල් නඩුවක් ද මේ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතී. | ණය පදනමින් භාණ්ඩ සැපයීමේදී අය කර ගැනීමේ හැකියාව තහවුරු කර ගත යුතුය. |
| (ඈ)ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ගැනුම්කරුවෙකුගෙන් අයවිය යුතු මුදල වශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නීතිමය ක්‍රියාමාර්ග අනුව ලැබිය යුතු මුදල් රු.5,574,811 ක් විය. ණය පදනම මත සහල් ලබාගත් බව ගැනුම්කරු විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් | ආනයනික සහල් විකිණීම වෙනුවෙන් ඩබ්.ආර් විජිත යන අයට විරුද්ධව අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇති අතර, ඒ අනුව විමර්ශන කටයුතු ආරම්භ කර ඇත. දැනට ප්‍රකාශ ලබාගැනීම් සිදුකර ඇත. තවද ඩබ්.ආර්. විජිත යන අයට සහල් විකිණීම හා මුදල් ලැබීම් සම්බන්ධව සම්පූර්ණ විගණනයක් සිදුකර විගණන | ණය පදනමින් භාණ්ඩ සැපයීමේදී අය කර ගැනීමේ හැකියාව තහවුරු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සංස්ථාව විසින් පැමිණිලි කර තිබුණි. | වාර්තාවක් ලබාදෙන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුම්දී ඇති අතර, ඒ අනුව ස්වාධීන විගණනයක් සිදුකර අදාල විගණන වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත භාරදී ඇත. | |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාවේ පවිත්‍රතා සේවය වෙනුවෙන් ගිවිසුමකට එළඹීමකින් තොරව පුද්ගලික ආයතනයක් වෙත රු.4,254,625 ක් ගෙවා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුල කොවිඩ් 19 ව්‍යාපෘතිය හේතුවෙන් රජය විසින් නිරෝධායන ඇඳිරිනීතිය පනවා තිබීම, සංචරන සීමා පනවා තිබීම ආදි හේතු මෙන්ම, රජයේ කාර්යාල අත්‍යාවශ්‍ය සේවකයන් පමණක් කැඳවා පවත්වා ගෙන යාම මතද ටෙන්ඩර් කැඳවීමට නොහැකි වී ඇති. 2020 වර්ෂයේ මිලටම 2021 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව තෝරා පත්කරගත් පවිත්‍රතා ආයතනයම මේ සඳහා යොදා ගෙන ඇති අතර 2020 වසරේ කොන්දේසින්ට යටත්වම සේවය ලබා ගෙන ඇත. එකී ආයතනයට අවශ්‍ය මාර්ගෝපදේශ / උපදෙස් සහිත ලේඛනයක් ලබා දී ඇති අතර, ඒ අනුව ගෙවීම් කරනු ලබයි. | සේවා කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම් වලට එළඹීමට කටයුතු කල යුතුය. |
| (ඊ) සංස්ථාවේ ප්‍රවාහන සේවා ආදායමෙන් සියයට 98 ක් ලංකා සතොස සමාගම වෙත සපයනු ලබන ප්‍රවාහන සේවා වෙනුවෙන් ලැබී තිබුණද ප්‍රවාහන සේවා වෙනුවෙන් ලංකා සතොස සමාගම සමග ලිඛිත ගිවිසුමකට එළඹීමට සංස්ථාව විසින් කටයුතු කර නො තිබුණි. | ලංකා සතොස ආයතනය හා ගිවිසුම් සම්බන්ධයෙන් කිහිපවරක් සාකච්ඡා පැවැත්වූ නමුත්, එක් ගමාන්තයක් සඳහා ගෙවිය යුතු / අයකළ යුතු කිලෝමීටර් ප්‍රමාණය සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර, එකගතාවයකට පත්වීමට නොහැකිවීම මත ගිවිසුම්ගතවීමට නොහැකි වන ලදි. කෙසේවුවත්, ඉන්වොයිස් වටිනාකම සදහා ලංකා සතොස ආයතනය විසින් කිලෝමීටර පදනම් කරගෙන ගෙවීම් කරන අතර, ගිවිසුම්ගතවීම සඳහා සාකච්ඡා කරමින් පවතී. | සේවා කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම් වලට එළඹීමට කටයුතු කල යුතුය. |
| (උ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රවාහන සේවා සැපයීමේදී 2017 වර්ෂයේදී අය කරන ලද රේටයන් මත ප්‍රවාහන ගාස්තු අයකර තිබුණු අතර ලොරිරථ වෙනුවෙන් අය කරනු ලබන රේටයන් 2017 වර්ෂයෙන් පසු වර්ෂ 05 ක් දක්වා සංශෝධනය කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ඉන්ධන මිළෙහි විශාල වශයෙන් වෙනස්කම් නොවූ අතර, එම කාලවකවානුව තුල වෙළඳපල පවත්නා මිළ ගණන් යටතේ ගෙවීම් කරන ලදි. කෙසේවුවත්, මිළ ගණන් වැඩි කිරීම සඳහා ඉල්ලීම් කලද ලංකා සතොස ආයතනය සිය පිරිවැය වැඩි කිරීමට නොහැකි බව සඳහන් කරමින් එකී ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලදි. කෙසේවුවත්, 2022 වර්ෂයේ දී ලොරි | අය කරනු ලබන රේටයන් කලීනව සංශෝධනය කල යුතුය. |

රජ වෙනුවෙන් අයකරනු ලබන රේටයන් සංශෝධනය කරන ලදී.

## 3.4 නිශ්කාර්ය සහ ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව සතුව වාහන 97 ක් පැවති අතර ඉන් වාහන 11 ක් ධාවනයෙන් ඉවත් කර සමස්ත වර්ෂය තුල නිශ්කාර්යව පැවතුනු අතර ඒ සම්බන්ධයෙන් 2020 ඔක්තොබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ වාහන 97 ක් පැවතියද ඉන් වාහන 11 ක් නිශ්කාර්යව පැවති අතර, එකී වාහන අපහරණය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවූ නමුත්, ඒ සම්බන්ධයෙන් ඇතිවූ ප්‍රායෝගික සහ නෛතික ගැටළු මත එකී ටෙන්ඩරය අවලංගු කළ අතර, නැවත එම වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට ප්‍රවාහන කළමණකාරු විසින් යෝජනා කළ අතර, ඒ අනුව එකී වාහන නැවත අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකිද යන්න සම්බන්ධයෙන් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැඳවීමට තිරණය කරන ලදි.<br>2023 වර්ෂයේ මේ සම්බන්ධයෙන් නැවත සලකා බැලීමක් සිදු කිරීමට තිරණය කර ඇත. | සංස්ථාවේ දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |
| (ආ) සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණය වසර 18 කට ආසන්න කාලයක සිට ඌණඋපයෝජිතව පවතින අතර සහල් සංකිර්ණ දෙකෙහිම පැයකට සහල් කි.ගෑ 2000 ක් බැගින් සැකසීමේ ධාරිතාවයක් පවතියි. කෙසේ වුවද ,සමාලෝචිත වර්ෂයේදී අදාල සහල් සංකීර්ණ දෙකෙහි කිසිදු සහල් නිශ්පාදනයක් සිදු නොකර නිෂ්කාර්යව පැවතුණු අතර, සහල් සැකසීමේ සංකීර්ණ දෙකෙහි සමාලෝචිත වර්ෂයේදී 03 ක සිට 20ක් දක්වා සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණු අතර වැටුප් , අතිකාල සහ දීමනා ඇතුළු සේවක පිරිවැය රු.13,902,442 ක් වී තිබුණි. | මෙම සංකීර්ණ දෙක සඳහා වී අලෙවි මණ්ඩලයෙන් වී තොග සපයා ගනු ලබන අතර ඔවුන් අත්පිට මුදලට පමණක් වී තොග නිකුත් කිරීම සිදු කරනු ලබයි.<br>ඒ අනුව 2021 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය සතුව පැවති වී තොග සීමාසහිත වූ අතර එම තොග සතොස වෙත හා පුද්ගලික අංශය වෙත එකවර නිකුත් කිරීම සිදු කරන ලදී. එහිදී සතොස වෙත එම කාලය තුල ලබා ගත හැකි වූ සීමිත වී තොග ප්‍රමාණය පමණක් ඇඹරීම සිදු කරන ලදී.<br>තවද, සතොස සෘජුවම වී තොග මිළදී ගැනීම සිදු කර නොමැති අතර ගොවීන්ගෙන් ප්‍රධාන වශයෙන් තෙත සහිත වී නිශ්පාදනය වන බැවින් හා එම වී තොග මිළදී ගෙන ඇඹරීම සඳහා මාස කීපයක් ගබඩාගතව පවත්වා ගැනීමට අවශ්‍ය වී වියළීමේ පහසුකම සතොස සතුව නොමැති බවද දන්වමි. | සංස්ථාවේ දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| | තවද මෙම සංකීර්ණ දෙක සඳහා ආරක්ෂක අංශය ඇතුළුව සතොස සේවකයින් යොදවා ඇති අතර එම සේවකයින් සංකීර්ණ දෙකෙන් ඉවත් කර සතොස වෙනත් ස්ථානයක සේවයේ යෙදවුවද ඔවුන් සඳහා වැටුප් ගෙවීමට සිදු වේ.<br>හිගුරක්ගොඩ සහ පන්නේගමුව සහල් සැකසීමේ සංකීර්ණයට අනුයුක්ත සේවකයන් සහල් සැකසීමේ කටයුතු සඳහා පුහුණු සේවකයන් බැවින් , ඔවුන් වෙනත් කාර්යකට යෙදවීමට නොහැකි බවත්, එම ගබඩා නිශ්කාර්යව පැවතියත් එකී ගබඩා නඩත්තු, සහල් සැකසීමේ යන්ත්‍ර පවිත්‍ර කිරීම්, භූමිය ආරක්ෂා කිරීම් කටයුතු සඳහා එම සේවකයන් යොදා ගන්නා ලදි. | |
| (ඇ) සංස්ථාව සතු හිඟුරක්ගොඩ සහ පන්නෙගමුව සහල් සැකසීමේ සංකීර්ණයට අනුබද්ධ ගබඩා 04 ක් ද සමාලෝචිත වර්ෂය මුළුල්ලේම නිෂ්කාර්යව පැවතුණි. | 2021 වර්ෂය තුල වී අලෙවි මණ්ඩලය සතුව වී තොග නොමැතිවීම හේතුවෙන් සතොස ආයතනය අඛණ්ඩව වී කෙටීමේ ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට නොහැකි විය. එමගින් සංස්ථාව සතු හිගුරක්ගොඩ සහ පන්නේගමුව සහල් සැකසීමේ සංකීර්ණය නිශ්කාර්යව පැවති අතර, හිගුරක්ගොඩ සහ පන්නේගමුව සහල් සැකසීමේ සංකීර්ණයට අනුබද්ධිත ගබඩා වී මෝල් ආශ්‍රිත නිෂ්පාදන හා සහල් ගබඩා කිරීම සඳහා යොදා ගැනීමට සකස් කර ඇති අතර, එකී ගබඩා වෙනත් කාර්යන් සඳහා භාවිතා කිරීම හෝ වෙනත් පාර්ශවයන් සඳහා කුලියට දීමට එම වසර තුල තිරණය කර නොමැත. තවද, කොවිඩ් වසංගතය හේතුවෙන් අවශ්‍ය අවස්ථාවකදී අත්‍යවශ්‍ය ආහාර ගබඩා කිරීම සඳහා එම ගබඩා වෙන් කර තබා ඇත. | සංස්ථාවේ දේපල ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදාගත යුතුය. |